වාර්ෂික
වාර්තාව
2020

2020 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹුවන

ශ්‍රී ලංකා ආර්ථිකය,
අභියෝග සහ ඉදිරි දැක්ම

1950-2020 Stability
Sustainability
Shared Prosperity

ආචාර්ය සුමිල තරංගා වානගුරු
අතිරේක අධ්‍යක්ෂ
ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ව්‍යවස්ථානුකූල අවශ්‍යතාව

2020 වර්ෂය සඳහා වන මෙම වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයෙහි හැත්තෑ එක් වන වාර්ෂික වාර්තාවයි.

මුදල් නීති පනතෙහි 35වන වගන්තිය:

... සෑම මුදල් වර්ෂයක් අවසාන වීමෙන් පසුව මාස හතරක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ තත්ත්වය ද, එම මුදල් වර්ෂය තුළ මුදල් මණ්ඩලය මගින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග පිළිබඳ සමාලෝචනයක් සහ මෙම ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හේතු වූ ආර්ථික හා මූල්‍ය තත්ත්වයන්ගේ විශ්ලේෂණයක් ද ඇතුළත් වාර්ෂික වාර්තාවක් මුදල් විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම මුදල් මණ්ඩලය විසින් සිදු කළ යුතු වේ...

වාර්ෂික වාර්තාවේ පෙළගැස්ම

I වන වෙළුම	**I කොටස**	-	ආර්ථිකයේ තත්ත්වය, එහි ක්‍රියාකාරිත්වය, ප්‍රතිපත්ති සහ ගැටලු සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය විශේෂ සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය
II වන වෙළුම	**II කොටස**	-	ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු
	III කොටස	-	මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන
	IV කොටස	-	2020 දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකා බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම්වලට අදාළ නීති අණපනත්

I කොටස - ආර්ථිකයේ තත්ත්වය, එහි ක්‍රියාකාරිත්වය, ප්‍රතිපත්ති සහ ගැටලු

1. ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති
2. ජාතික නිෂ්පාදිතය, වියදම , ආදායම සහ සේවා නියුක්තිය
3. ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්
4. මිල සහ වැටුප්
5. විදේශීය අංශයේ ප්‍රවණතා හා ප්‍රතිපත්ති
6. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු
7. මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය
8. මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

රජය හා මහ බැංකුව විසින් සිදු කරන ලද සුවිශේෂී ප්‍රතිපත්තිමය මැදිහත්වීම් තුළින්, 2020 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සංකීර්ණ අභියෝගයන්ට කාර්යක්ෂම ලෙස මුහුණ දුන්නේය.

කොවිඩ්-19 වසංගතයෙන් පැන නැගුණු ගැටලු හේතුවෙන් සමාජ ආර්ථික බලපෑම් ඇති වීම සහ, එහි ප්‍රතිඵලයක් ලෙස කුටුම්භ ඒකක හා ව්‍යාපාර වෙත වූ බලපෑම අවම කිරීම සඳහා මෙම ප්‍රතිපත්තිමය මැදිහත්වීම් අත්‍යවශ්‍ය විය.

එසේම, ආර්ථිකය තුළ විශ්වසනීයත්වය තහවුරු කිරීමටත්, එමගින් සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව මත ඇති කෙරෙන දැඩි පීඩනය වළක්වාලීමටත් එවැනි මැදිහත්වීම් අවශ්‍ය විය..

2020 වසර ආරම්භයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ...

පාස්කු ඉරිදා ප්‍රහාරයේ විනාශකාරී බලපෑම්වලට මුහුණ දීමෙන් පසු...

... සහ 2019 වසර තුළ පැවති අස්ථාවර දේශපාලන වාතාවරණයෙන් අනතුරුව

2020 වසර ආරම්භයේ දී ශ්‍රී ලංකා ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වීමේ ගමන් මගකට අවතීර්ණව සිටි අතර,

2019 වසර අවසානය වන විට වැඩිදියුණු වූ දේශපාලන ස්ථාවරත්වය මගින් අපේක්ෂාවන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවිණි...



මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය(%)



Source: LMD

2020 වසර ආරම්භයේ පැවති අභියෝග...

- 2019 වසර අවසන් වන විට ශ්‍රී ලංකාව මුහුණ දුන් ප්‍රධානතම අභියෝගය වූයේ වසර කිහිපයක් ම අඩු වර්ධන වේගයක් පෙන්නුම් කළ ආර්ථිකය පුනර්ජීවනය කිරීමයි
- ඒ අනුව, රජය සහ මහ බැංකුව විසින් ආර්ථිකය පුනර්ජීවනය අරමුණු කර ගත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ලදී
  - රාජ්‍ය ආදායමේ පහළ යෑමක් සිදු වුව ද, ව්‍යාපාරවලට සහ ආර්ථික වර්ධනයට සහාය වීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණ විය
  - අඩු උද්ධමනකාරී පසුබිමක, ලිහිල් මුදල් ප්‍රතිපත්තිය තුළින් ආර්ථික වර්ධනය සඳහා අඛණ්ඩව සහාය සැපයීම අපේක්ෂා කෙරිණි
- වර්ධනාභිමුක ප්‍රතිපත්ති වාතාවරණයට සහයෝගය දැක්වීම සඳහා දීර්ඝ කාලීනව පවතින ව්‍යුහාත්මක ගැටලු විසඳීම සහ දේශීය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය විය

කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතය පැතිරීම හා වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හමුවේ ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් මෙන්ම ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියද දැඩි දුෂ්කරතාවලට මුහුණ දුන්නේය...

වසංගතය හා ඉන් ඇතිවූ අහිතකර ප්‍රතිවිපාක මැඩපැවැත්වීම සඳහා රජය සහ මහ බැංකුව විසින් ප්‍රතිපත්ති හා මෙහෙයුම් ක්‍රියාමාර්ග රාශියක් ගෙන තිබේ ...

සෞඛ්‍ය හා ප්‍රජාව ආශ්‍රිත ක්‍රියාමාර්ග

- සංචරණය ආශ්‍රිත සීමා
- පීසීආර් පරීක්ෂණ සහ ශීඝ්‍ර ප්‍රතිදේහජනක පරීක්ෂා (PCR and Rapid Antigen Tests
- සෞඛ්‍ය පහසුකම් සැපයීම
- ප්‍රජා දැනුම්වත් කිරීමේ වැඩසටහන්
- පූර්වෝපායික එන්නත්කරණ වැඩසටහන්

මුදල්, රාජ්‍ය මූල්‍ය සහ වෙනත් ක්‍රියාමාර්ග

- අවශ්‍යතා සහිත පවුල් සඳහා රාජ්‍ය මූල්‍ය සානුබල සහ මූල්‍යාධාර
- මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග
- කාරක ප්‍රාග්ධන ණය
- ඉදිකිරීම් සහ වෙනත් අංශ සඳහා ද්‍රවශීලතා පහසුකම්
- ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම සහ මූල්‍ය අංශයේ නියාමන ක්‍රියාමාර්ග

මෙම විශේෂ ප්‍රතිපත්තිමය මැදිහත්වීම් 2020 වසරේ දී ඇති වූ සංකීර්ණ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට උපකාරී විය...

කොවිඩ්-19 වසංගතයෙහි පළමු හා දෙවන රැල්ල සාපේක්ෂ වශයෙන් අඩු මරණ අනුපාතිකයක් සමඟ සාර්ථකව කළමනාකරණය කරන ලදි...

වසංගතය පැතිරීමත් සමඟ ඒ සඳහා මුහුණ දීමේ හැකියාව වැඩිදියුණු කරමින් රාජ්‍ය හා පෞද්ගලික අංශ නිවසේ සිට රාජකාරි කටයුතු කිරීමට පෙළඹුණි...

ණය ආපසු ගෙවීම සඳහා සහන කාලයක් ලබා දීම, අඩු පිරිවැය මූල්‍යනය සඳහා වූ ප්‍රවේශය ඉහළ යෑම මෙන්ම අඩු බදු ක්‍රමය හේතුවෙන් ව්‍යාපාරිකයින්ට සහ පුද්ගලයන්ට අභියෝග සඳහා සාර්ථකව මුහුණ දීමට හැකි විය...

වසරේ අවසාන කාර්තුවේ දී මතු වූ දෙවන රැල්ල නිසා යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියට බාධා ඇති වූව ද, 2020 වසරේ දෙවන භාගයේ දී ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ප්‍රබල සලකුණු පෙන්නුම් කළේය.

එහෙත්, ඉදිරියේ සැලකිය යුතු අභියෝග රැසක් පවතී

- වසංගතය නැවත හිස එසවීම සහ එමගින් ආර්ථිකයට ඇතිවන අහිතකර බලපෑම කළමනාකරණය
- සීමිත මූල්‍ය ගලා ඒම් මධ්‍යයේ විශාල විදේශීය ණය සේවාකරණ ගෙවීම් කළමනාකරණය
- පුළුල් බලපෑමක් ඇති කරන ප්‍රතිසංස්කරණ තුළින් දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම
- ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලිය ස්ථාවරව වූ පසු රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්තිවලින් ලබා දෙන සහාය කාලානුරූපීව අඩු කිරීමට අවශ්‍ය කටයුතු කළමනාකරණය කිරීම



මූර්ත ද. දේ. නි. -3.6%
ආයෝජන වියදම්
2019 -2.1
ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය (ද. දේ. නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
2020 -1.4
ශුද්ධ විදේශ ඉල්ලුම අඩුවීම, -3.5%
ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (එ.ජ. ඩොලර්)
3,852 (2019)
3,682 (2020)
භාණ්ඩ අපනයන අඩුවීම
භාණ්ඩ ආනයන අඩුවීම
වෙළඳ හිඟය
සංචාරක අංශය
විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළේය
දළ නිල සංචිත
2019 එ.ජ.ඩො. බිලියන 7.6
2020 එ.ජ.ඩො. බිලියන 5.7
සේවා වියුක්තිය
4.8%
5.5%
2019
2020
මතුපිට උද්ධමනය සමස්තයක් වශයෙන් අපේක්ෂිත පරාසය තුළ පැවතුන අතර මූලික උද්ධමනය පහළ මට්ටමක පැවතුණි...
ජන. - 20
දෙසැ.-20.
විදේශීය සෘජු ආයෝජන සහ විවිධ ආයෝජන ගලා ඒම මන්දගාමී විය.
එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම සියයට 2.6කට සීමා විය.
අප්‍රේ. 20
අගෝ. 20
දෙසැ. 20
2020 දී ශ්‍රී ලංකා ආර්ථිකය
ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිය පහත හෙලීම සහ අහිතකර ගෝලීය මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ විදේශ මූල්‍යනය සඳහා වූ ප්‍රවේශය සීමිත විය...
...2020 වසර තුළ දී අයවැය හිඟය දේශීය මූලාශ්‍ර තුළින් මූල්‍යනය කෙරුණි
රජයේ සමස්ත අයවැය හිඟය (ද. දේ. නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
2019 -9.6
ආදායම 2019: 12.6 2020: 9.1
පුනරාවර්තන වියදම් 2019: 16.1 2020: 17.0
ප්‍රාග්ධන වියදම් 2019: 6.1 2020: 3.3
2020 -11.1
මධ්‍යම රජයේ නොපියවූ ණය (ද. දේ. නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)
86.8 (2019)
101.0 (2020)
මධ්‍යම රජයේ සමස්ත ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස සමස්ත නොපියවූ විදේශීය ණය ප්‍රමාණය (%)
47.6 (2019)
40.0 (2020)
පෞද්ගලික අංශයට ලබා දෙන ලද ණය
රජයට ලබා දෙන ලද ණය
M2b
මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම තහවුරු කරන ලදී
ප්‍රතිපත්ති පොළී අනුපාතික 250 පදනම් අංක
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය 300 පදනම් අංක
බැංකු අනුපාතිකය 650 පදනම් අංක
සහන ණය යෝජනා ක්‍රම
රජයට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම

ජාතික නිෂ්පාදිතය,
වියදම, ආදායම හා
සේවා නියුක්තිය,

ආර්ථික සහ සමාජ
යටිතල පහසුකම්

හා

මිල සහ වැටුප්

කොවිඩ්-19 වසංගතයේ බලපෑම පිළිබිඹු කරමින් 2020 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය පසුබෑමට ලක් විය...

ආංශික වර්ධන වේගය (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කෘෂිකර්මාන්ත අංශය :

↓ ධීවර
තෙල් සහිත පලතුරු බෝග
තේ වගාව
වන වගාව හා දැව
සත්ත්ව නිෂ්පාදන

↑ එළවළු වගාව
වී වගාව
වී හැර අනෙකුත් ධාන්‍ය වගාව
පලතුරු වගාව

කර්මාන්ත අංශය :

↓ ඉදි කිරීම්
රෙදිපිළි සහ ඇඟලුම් නිෂ්පාදනය
සම් හා සම් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය
පතල් සහ කැණීම්

↑ ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන නිපදවීම

සේවා අංශය :

↓ මගී සහ භාණ්ඩ ප්‍රවාහන සහ ගබඩා පහසුකම්
වෙනත් පෞද්ගලික සේවා
නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා

↑ මූල්‍ය සහ මූල්‍ය අතරමැදි සේවාවන්
විදුලි සංදේශ
තොග සහ සිල්ලර වෙළඳාම

ආර්ථික කටයුතු	වාර්ෂික වර්ධන අනුපාතිකය %	
	2019	2020
කෘෂිකර්මාන්තය, වනවගාව සහ ධීවර	1.0	-2.4
කර්මාන්ත	2.6	-6.9
සේවා	2.2	-1.5
භාණ්ඩ මත බදු අඩු කිරීම සහනාධාර	2.4	-8.0
ද.දේ.නි.	**2.3**	**-3.6**

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දළ අගය එකතු කිරීමට දක්වන දායකත්වය



- **වසරේ දෙවන කාර්තුවේ දී ආර්ථිකය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 16.4කින් සංකෝචනය වීම, 2020 වසරේ දී ආර්ථිකයේ සමස්ත සංකෝචනයක් වාර්තා වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය**

ආයෝජන වියදම් සහ ශුද්ධ විදේශ ඉල්ලුම දුර්වල වූ අතර 2020 වසරේ දී පරිභෝජන වියදම් සුළු වශයෙන් වර්ධනය විය...

2020 දී , පවත්නා වෙළඳපොළ මිල ගණන් යටතේ, ද.දේ.නි.හි වියදම් ප්‍රවේශයට අනුව,

- 2019 වසරේ දී සියයට 5.5ක සංකෝචනයක් වාර්තා කළ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ද.දේ.නි.න් සියයට 25.2), 2020 වසරේ දී, සියයට 6.2කින් තවදුරටත් පහළ ගියේය.
- ජාත්‍යන්තර ඉල්ලුම මන්දගාමී වීම, දේශ සීමා වසා දැමීම හේතුවෙන් සංචාරක කර්මාන්තයට දැඩි ලෙස බලපෑමක් ඇතිවීම මෙන්ම විදේශ අංශය වෙත එල්ල වී ඇති පීඩනය අවම කිරීම අරමුණු කරගනිමින් ආනයන සීමා පැනවීම ඇතුළු සියලු කරුණුවල ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින් භාණ්ඩ හා සේවා සඳහා වූ ශුද්ධ විදේශ ඉල්ලුම සියයට 3.5කින් පහළ ගියේය
- කෙසේ වෙතත්, පරිභෝජන වියදම් (ද.දේ.නි. දක්වන ලද දායකත්වය සියයට 81.1), 2019 වසරේ දී දක්නට ලැබුණු සියයට 7.4ක වර්ධනයට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 2.1ක වර්ධනයක් වාර්තා කර තිබේ

- **ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතිරිකිරීම්, 2019 වසරේ දී පැවති සියයට 20.7ක සිට 2020 වසරේ දී සියයට 18.9 දක්වා අඩු විය**
  - පුද්ගලික ඉතුරුම් සියයට 10.0කින් වර්ධනය වුව ද, රාජ්‍ය නිර්-ඉතුරුම් වැඩිවීම දේශීය ඉතිරිකිරීම් පහත වැටීමට හේතු විය
- **ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතිරිකිරීම්, 2019 වසරේ දී පැවති සියයට 24.7ක සිට 2020 වසරේ දී සියයට 23.9ක් දක්වා අඩු විය**
  - විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම වැඩිවීම ජාතික ඉතුරුම් පහත වැටීම සීමා කිරීමට උපකාරී විය
  - ජාතික ඉතුරුම්වලට වඩා ආයෝජන තීව්‍ර ලෙස පහත වැටීම හේතුවෙන් ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය, 2019 වසරේ දී පැවති ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට -2.1 සිට 2020 වසරේ දී සියයට -1.4 දක්වා අඩු විය.

ඉතිරිකිරීම්, ආයෝජන හා ඉතුරුම්-ආයෝජන පරතරය (ද.දේ.න.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

Sources: Department of Census and Statistics
Central Bank of Sri Lanka

කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම පිළිබිඹු කරමින් 2019 වසරේ දී සියයට 4.8 ක් වූ විරැකියාව 2020 වසරේ දී සියයට 5.5ක් දක්වා ඉහළ ගියේය...

- **ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය (ශ්‍ර.බ.ස.අ) 2019 වසරේ දී පැවති සියයට 52.3ක සිට 2020 වසරේ දී සියයට 50.6ක් දක්වා අඩු විය**

  පුරුෂ ශ්‍ර.බ.ස.අ. : 73.0% → 71.9% ස්ත්‍රී ශ්‍ර.බ.ස.අ.: 34.5% → 32.1%

- **සේවා නියුක්ත ජනගහනය 2019 වසරේ වාර්තා වූ මිලියන 8.181ක සිට 2020 වසරේ දී මිලියන 7.999ක් දක්වා අඩු විය.** රැකියා පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කර්මාන්ත හා සේවා කටයුතුවල රැකියා නියුක්තිය අඩුවීමයි.

සේවා නියුක්තියේ දායකත්වය	2019	2020
කෘෂිකර්මාන්ත	25.3%	27.1%
කර්මාන්ත	27.6%	26.9%
සේවා	47.1%	46.0%

සේවා වියුක්ති අනුපාතිකය (%)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ශ්‍රම වෙළඳපොළ දර්ශක



කොවිඩ්-19 අභියෝග මධ්‍යයේ සෞඛ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යන ලදී...

කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියේ පළමු රැල්ල සහ දෙවනි රැල්ල මැඩපැවැත්වීමේ දී ශ්‍රී ලංකාව දැඩි අභියෝගවලට මුහුණ දුන් නමුත්, සෞඛ්‍ය අංශයේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ඒකාබද්ධ ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 වසරේ දී රෝගීන් ගණන පාලනය හැකි මට්ටමක පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය

	2020 දෙසැම්බර් අග	2021 මාර්තු අග
ආසාධිත සංඛ්‍යාව	43,299	92,706
පුද්ගලයින් මිලියනයකට රෝගීන්	1,946	4,229
මරණ අනුපාතය	0.47%	0.61%
එන්නත්කරණය	-	පුද්ගලයින් 100කට මාත්‍රා 4.2

කොවිඩ් -19 ආශ්‍රිතව මතු වූ සීමා මධ්‍යයේ බෝ නොවන රෝග සහිත පුද්ගලයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා රාජ්‍ය සෞඛ්‍ය සේවා පද්ධතිය නව්‍ය ප්‍රයත්නයන් අනුගමනය කළේය

තහවුරු කරන ලද කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව සහ සිදු කරන ලද පී.සී.ආර්. පරීක්ෂණ (දෛනික අගය)



මූලය: සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්යක්ෂම සේවය මගින් වෛරසය පැතිරීම මැඩ පැවැත්වීමට, අඩු මරණ අනුපාතයක් පවත්වා ගැනීමට සහ ආර්ථික ක්‍රියාකාරකම් සාපේක්ෂව වේගයෙන් යථා තත්ත්වයට පත් කිරීමට හැකි විය.

රාජ්‍ය අංශය

වෛද්‍යවරුන් සංඛ්‍යාව (එක් වෛද්‍යවරයෙකු සඳහා පුද්ගලයන් සංඛ්‍යාව)	හෙද නිලධාරීන් සංඛ්‍යාව (එක් හෙද නිලධාරියෙකු සඳහා පුද්ගලයන් සංඛ්‍යාව)	ඇඳන් සංඛ්‍යාව (පුද්ගලයන් දහසකට)
1,117	582	3.5

ආයුර්වේද වෛද්‍ය අංශය

ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව	රෝහල් සංඛ්‍යාව	ඇඳන් සංඛ්‍යාව
26,061	118	5,058

පෞද්ගලික අංශය



රෝහල් සංඛ්‍යාව	ඇඳන් සංඛ්‍යාව
217	5,173

පෙර නොවූ විරූ අභියෝග මධ්‍යයේ රජය විසින් අධ්‍යාපන සේවා සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී...

2020 මාර්තු මාසයේ සිට බස්නාහිර පළාත පුරා දීර්ඝතම කාලයක් පුරාවට ද, වරින් වර රට පුරා ද පාසල් සහ විශ්වවිද්‍යාල වසා දැමීම මධ්‍යයේ වුව ද, අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ඊ-තක්සලාව, ගුරුගෙදර සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය වැනි නව වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී

අධ්‍යාපන කටයුතු ඩිජිටල් වේදිකා වෙතට වේගයෙන් සංක්‍රමණය වීම අගය කළ හැකි වුව ද, විශේෂයෙන් ම අඩු ආදායම්ලාභී පවුල්වල ළමයින්, දුෂ්කර පළාත්වල ජීවත් වන ළමුන් සහ තොරතුරු හා විදුලි සංදේශ තාක්ෂණ පහසුකම් අඩු සිසුන් මෙන්ම විවිධ ඉගෙනුම් දුෂ්කරතාවලින් පෙළෙන්නන් සැලකූ විට, එවැනි ක්‍රමවේදවල කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ගැටලු මතු වී තිබේ...

ආර්ථිකයේ ශ්‍රම අවශ්‍යතා හඳුනාගැනීම සඳහා අධ්‍යාපන අංශය විසින් රාජ්‍ය සහ පෞද්ගලික පාර්ශ්වකරුවන් සමඟ කටයුතු කිරීමට මෙන්ම, කුසලතා ඉහළ නැංවීම හා නව කුසලතා ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය...

අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කිරීම සඳහා ගත් නව ප්‍රයත්න

නව ඉගෙනුම් ක්‍රම වෙත අනුගත වීම

මිශ්‍ර ඉගෙනුම් ක්‍රම
- ඊ-තක්සලාව
- ගුරු ගෙදර
- කාර්ය සටහන් පත්‍ර
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය
  - සූම් තාක්ෂණ සැසි 502,000
  - මිලියන 22.3ක අන්තර්ජාල සහභාගීත්වය

අඛණ්ඩව අධ්‍යාපන කටයුතු සිදු කිරීමේ ක්‍රියාවලිය කළමනාකරණය කිරීම

- අධ්‍යාපන අමාත්‍යාංශයේ හදිසි තත්ත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමේ සැලසුම (CERP)
- ප්‍රමාද වීම මධ්‍යයේ වුවත් සියලුම ජාතික මට්ටමේ විභාග පැවැත්වීම
- ගුරුවරුන්ගේ මංගත ක්‍රම හරහා ඉගැන්වීමේ හැකියාව වැඩි දියුණු කිරීම
- තාක්ෂණික පහසුකම් වෙත ප්‍රවේශ වීමේ දී ඇති වන ගැටලු විසඳීම

22.2% ඩෙස්ක්ටොප් පරිගණක හෝ ලැප්ටොප් පරිගණක සහිත ගෘහ ඒකක

32.0% පරිගණක සාක්ෂරතාව

ඊ තක්සලාව
The National e-learning Portal for the General Education

සමාජ ආර්ථික කටයුතු සීමා කර තිබූ කාලයේ දී අඩු ආදායම්ලාභී හා අවදානමට ලක්විය හැකි ගෘහ ඒකකවල සමාජ ආර්ථික යහපැවැත්ම ඉහළ නැංවීමට රජය පියවර ගත්තේය...

රජය අවදානමට ලක් විය හැකි ගෘහ ඒකකයකට රු. 5,000.00ක් බැගින් වූ දීමනාවක් අවස්ථා දෙකක දී ලබා දීමට කටයුතු කළේය

ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම

වර්ෂය	දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන		පෝෂණ දීමනා වැඩසටහන		වියළි සලාක වැඩසටහන
	පවුල් සංඛ්‍යාව (අ)	වටිනාකම (රු. මිලියන) (ආ)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (අ)	වටිනාකම (රු. මිලියන) (ඇ)	වටිනාකම (රු. මිලියන)
2016	1,407,235	40,740	337,554	5,746	111
2017	1,388,242	39,707	372,407	5,408	84
2018	1,384,021	39,239	329,047	5,490	58
2019	1,800,182	44,660	300,246	5,279	105
2020	1,770,086	52,472	238,034	4,761	ලැ.නො.

(අ) වසර අවසානයේ දී
(ආ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව
(ඇ) 2020 දත්ත කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය මත පදනම් වන නමුත් 2016 සිට 2019 දක්වා කාල සීමාව තුළ දත්ත මුදල් අමාත්‍යාංශය මත පදනම් වේ.

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
මුදල් අමාත්‍යාංශය

දරිද්‍රතා දර්ශකය - 2016 දිස්ත්‍රික්ක දත්ත මත පදනම් වූ තීව්‍රතා සිතියම

පසුගිය දශක කිහිපය තුළ දී දරිද්‍රතාව සැලකිය යුතු ලෙස පහළ ගියද, පළාත් සහ දිස්ත්‍රික්ක අතර දරිද්‍රතා මට්ටම්වල සැලකිය යුතු විෂමතා දක්නට හැකිය.



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ත ජනතාවට පිරිසිදු හා ආරක්ෂිත පානීය ජලය සැපයීම සහතික කිරීම සඳහා රජය අඛණ්ඩව ප්‍රයත්න දැරීය.

2020 දී,
ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය
93.2% (2019 දී 91.9%)
නල ජලය සඳහා ප්‍රවේශය
53.1% (2019 දී 51.8%)

1950-2020 Stability Sustainability Shared Prosperity

කොවිඩ්-19 මගින් නිර්මාණය කරනලද අභියෝගවලට විදුලි සංදේශ අංශය පූර්වෝපායිකව අනුගත විය...

- කොවිඩ්-19 ආශ්‍රිත සීමා පැනවීම් මධ්‍යයේ අත්‍යාවශ්‍ය සම්බන්ධතා හරහා ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට විදුලි සංදේශ අංශය පහසුකම් සැලසුවේය
- 'නිවසේ සිට වැඩ කිරීමේ' ක්‍රමවේදය හඳුන්වාදීම සහ සංචරණ සීමා පැනවීම සමඟ අන්තර්ජාල භාවිතයේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි

දුරකථන ඝනත්වය - 143.0
අන්තර්ජාල ඝනත්වය - 79.9



බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය



1950-2020 Stability Sustainability Shared Prosperity

වසරේ දෙවන කාර්තුව තුළ දීපව්‍යාප්තව ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම හේතුවෙන් බලශක්ති ඉල්ලුම සැලකිය යුතු ලෙස පහළ ගිය අතර, ඉන් අනතුරුව එය වසංගත තත්ත්වයට පෙර පැවති මට්ටමට ක්‍රමයෙන් ළඟාවිය...

- බොරතෙල් (බ්‍රෙන්ට්) බැරලයක මිලෙහි සාමාන්‍යය පසුගිය වසරේ පැවති එ.ජ. ඩොලර් 64.04ට සාපේක්ෂව 2020 දී එ.ජ. ඩොලර් 43.35 ක් දක්වා සියයට 32.3කින් අඩු විය. 2000 වසරේ සිට මේ දක්වා වාර්තා වූ බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක අඩුම මිල 2020 අප්‍රේල් මැද භාගයේ දී වාර්තා විය
- අසාමාන්‍ය ලෙස ජාත්‍යන්තර වෙළඳපොළේ පහළ ගිය තෙල් මිලෙහි ප්‍රතිලාභ ආර්ථිකය පුරා සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කිරීමේ සඳහා දේශීය ඉන්ධන මිල ගණන් සංශෝධනය කිරීම වෙනුවෙන් 2020 මාර්තු මාසයේ දී ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල පිහිටුවන ලදී
- වසර තුළ දී, දේශීය වෙළඳපොළේ ඛනිජ තෙල් නිෂ්පාදන විකුණුම් සියයට 16.8කින් පහළ ගියේය.

ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් (බ්‍රෙන්ට්) සාමාන්‍ය මිල සහ ලං.ඛ.නී.සං. බොරතෙල් ආනයන මිල



- 2020 වසරේ දී සමස්ත විදුලි උත්පාදනය ගි.වො.පැ. 15,714ක් දක්වා සියයට 1.3කින් පහළ ගියේය
- විදුලිය සඳහා ගෘහස්ත අංශයේ ඉල්ලුමෙහි වර්ධනය ඉක්මවා කර්මාන්ත අංශයේ ඉල්ලුම පහළ යෑම බොහෝ දුරට හේතුකොටගෙන, 2020 වසරේ දී මුළු විදුලිබල අලෙවිය ගි.වො.පැ. 14,287ක් දක්වා සියයට 2.2කින් අඩු විය

ප්‍රධාන අංශ සඳහා විදුලිබල අලෙවියේ ක්‍රියාකාරීත්වය

	ගෘහස්ථ සහ ආගමික	කර්මාන්ත	පොදු සේවා සහ හෝටල්	සමස්ත
	6.4%	-5.2%	-9.1%	-2.2%
2019	4,863	4,392	3,563	14,611
2020	5,172	4,164	3,238	14,287

විදුලිබල උත්පාදන සංයුතිය



1950-2020 Stability Sustainability Shared Prosperity

ප්‍රවාහන කටයුතු සහ වරාය මෙහෙයුම් වසර තුළ දී පසුබෑමට ලක් විය...

මහාමාර්ග ප්‍රවාහනය

මගී කිලෝමීටර (බිලියන)- ශ්‍රී ලං.ග.ම.



මගී කිලෝමීටර (බිලියන) - පෞද්ගලික අංශය



දුම්රිය ප්‍රවාහනය

මගී කිලෝමීටර (මිලියන)



භාණ්ඩ ටොන් කිලෝමීටර (මිලියන)



ගුවන් සේවා

මගී කිලෝමීටර (මිලියන)



භාණ්ඩ (මෙ.ටො.'000)



බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්



මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

වරාය ක්‍රියාකාරකම්වල ක්‍රියාකාරීත්වය



මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

භාණ්ඩ හැසිරවීම් — 3.8% — මෙ.ටො. මිලියන 102.91

බහලු මෙහෙයුම් — 5.2% — අඩි විස්සට සමාන බහලු ඒකක මෙ.ටො. මිලියන 6.86

බහලු ප්‍රතිනැව්ගත කිරීම් — 3.2% — අඩි විස්සට සමාන බහලු ඒකක මෙ.ටො. මිලියන 5.77

වසංගතය නිසා ඇති වූ බාධා මධ්‍යයේ වුව ද, 2020 දී භෞතික යටිතල පහසුකම් ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක විය...

- **මාතර සිට හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය** 2020 දී අඛණ්ඩව ක්‍රියාත්මක විය.
  - ගොඩගම, පාලටුව, බෙලිඅත්ත සහ බරවකුඹුක සම්බන්ධ කරන අධිවේගී මාර්ග කොටස 2020 පෙබරවාරි මාසයේ දී මහජනයාට විවෘත විය.
  - අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට දක්වා දිවෙන අධිවේගී මාර්ගය ද 2020 දී නිම කරන ලදී.
- **මධ්‍යම අධිවේගී මාර්ගයේ** ඉදිකිරීම් කටයුතු 2020 දී ද අඛණ්ඩව සිදු විය.

- **2020 දී කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු ද අඛණ්ඩව සිදු විය.**
  - බාහිර උපයෝගිතා සැපයුම් යටිතල පහසුකම් ඉදිකිරීමේ කටයුතු වසර තුළ දී සිදුවෙමින් පැවතුණි
  - මූල්‍ය හා වාණිජ මධ්‍යස්ථානය ඉදිකිරීමේ මූලික කටයුතු ආරම්භ කරන ලදී
  - මෙම ව්‍යාපෘතිය දකුණු ආසියානු කලාපයේ විශේෂ ආර්ථික කලාපයක් බවට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත 2021 මාර්තු 24 දින ගැසට් කරන ලදී

2020 වසර තුළ දී මතුපිට උද්ධමනය, සමස්ථයක් වශයෙන් සියයට 4 - 6 අතර අපේක්ෂිත පරාසයේ පැවති අතර, මූලික උද්ධමනය පහළ මට්ටමක පැවතුණි...

වසංගතය හේතුවෙන් ඇති වූ සැපයුම් අවහිරතා නිසා විශේෂයෙන් ම, ඇතැම් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් ආහාර කාණ්ඩයේ උද්ධමන පීඩනය ඉහළ යෑම මධ්‍යයේ වුව ද, අඩු ඉල්ලුම් තත්ත්වයන්, මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා සහ පහළ දැමූ පරිපාලිත මිල ගණන්, උද්ධමනය ඉලක්කගත මට්ටමෙහි පවත්වා ගැනීමට උපකාර විය.

- කො. පා. මි. ද.යේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය පහළ ගිය අතර, එය 2019 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 4.8ට අගයට සාපේක්ෂව 2020 වසර අවසානයේ දී සියයට 4.2ක් ලෙස වාර්තා විය
- ජා. පා. මි. ද.යේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2019 දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ සියයට 6.2ට අගයට සාපේක්ෂව 2020 වසර අවසානයේ දී සියයට 4.6ක් දක්වා පහළ ගියේය
- කො. පා. මි. ද. සහ ජා. පා. මි. ද. අනුව මනිනු ලබන පරිදි, මූලික උද්ධමනය, 2020 වසර මුළුල්ලේ පහළ මට්ටමක පැවතුණි



විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, විදේශීය අංශය 2020 වසර තුළ දී මුහුණ දීමට සිදු වූ ප්‍රබල බාධකයන්ට එරෙහිව ක්‍රියාත්මක විය...

අපනයන ඉපැයීම් කෙටි කාලපරිච්ඡේදයක් තුළ දී වසංගතයට පෙර පැවති මට්ටමට නැවත ළඟා විය...

- **2020 වසරේ දී අපනයන ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 10,047ක් දක්වා සියයට 15.9කින් පහත වැටුණි :**
- **අපනයන ඉපැයීම් පහත වැටුණු ප්‍රධාන අයිතම :**
  - ඇඟලුම් (-24.3%)
  - ඛනිජ තෙල් නිෂ්පාදිත (-28.3%)
- **පෞද්ගලික සනීපාරක්ෂක උපකරණ සහ ඇතැම් කෘෂිකාර්මික අපනයන ඉපැයීම් ඉහළ ගියේය :**
  - ප්ලාස්ටික් හා උපාංග (140.0%)
  - නිමකළ රෙදිපිළි (110.3%)
- එක්සත් ජනපදය (25%) ශ්‍රී ලංකාවේ අපනයන සඳහා ප්‍රධාන ගැනුම්කරුවා වූ අතර, ඉන් පසුව එක්සත් රාජධානිය (9%) සහ ඉන්දියාව (6%) ප්‍රධාන ගැනුම්කරුවන් විය



අපනයන සංයුතිය - 2020



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන වෙළඳ දිශාව - 2020



මූලය: ශ්‍රී ලංකා රේගුව

1950-2020 Stability Sustainability Shared Prosperity

අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සීමා කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග සහ ලෝක වෙළඳපොළෙහි ඛනිජ තෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතීම, 2020 වසරේ ආනයන වියදම පහළ යෑම සඳහා හේතු විය...



- **2020 වසරේ දී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 16,055ක් දක්වා සියයට 19.5කින් අඩු විය:**

- **ආනයන වියදම පහත වැටුණු ප්‍රධාන අයිතම :**
  - ඉන්ධන (-34.7%)
  - රෙදිපිළි හා රෙදිපිළි උපාංග (-19.7%)
  - පෞද්ගලික රථවාහන (-65.3%)

- **ආනයන වියදම ඉහළ ගිය ප්‍රධාන අයිතම :**
  - තෙල් හා මේද (ප්‍රධාන වශයෙන් පොල්තෙල්) (263.7%)
  - සීනි හා රසකැවිලි (37.7%)
  - බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත (7.8%)

- **ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන මූලයන් ලෙස ප්‍රධාන වශයෙන් චීනය (22%) හා ඉන්දියාව (19%) ද ඉන් පසුව එක්සත් අරාබි එමීර් රාජ්‍යයද (6%) පැවතුණි**

ආනයන සංයුතිය - 2020



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ආනයන වෙළඳ දිශාව - 2020



මූලය: ශ්‍රී ලංකා රේගුව

1950-2020 Stability Sustainability Shared Prosperity 70

ඒ අනුව, වෙළඳ හිඟය කැපී පෙනෙන ලෙස අඩු විය...

වෙළඳ හිඟය පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,008ක් දක්වා එ.ජ. ඩොලර් මිලියන 1,989කින් අඩු විය

අපනයන, ආනයන සහ වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් බිලියන)



මූලාශ්‍ර: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව



වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක



මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශීය ජංගම ගිණුමේ හිඟය අඩු වූ අතර, මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ද අඩු විය...



විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල හැසිරීම පිළිබඳ වැඩිදුර විශ්ලේෂණයක් විශේෂ සටහනක් මඟින් ඉදිරිපත් කර ඇත...

- මූල්‍ය ගිණුම වෙත ලැබුණු ප්‍රධාන ලැබීම් අතරට චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 500ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම, ඉන්දියානු සංචිත බැංකුව විසින් ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය යටතේ එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම සහ විදේශීය සෘජු ආයෝජන (ණය ද ඇතුළුව) ආකාරයෙන් වූ එ.ජ. ඩොලර් මිලියන 670ක ලැබීම් ඇතුළත් විය.

- ප්‍රධාන ගෙවීම් අතරට රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ විදේශීය ආයෝජන ගෙවීම් සහ 2020 ඔක්තෝබර් මාසයේ දී සිදු කරන ලද එ.ජ. ඩොලර් බිලියන 1ක් වූ කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම ඇතුළත් විය.

විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ විදේශ විනිමය ලැබීම් සීමිත වීම මධ්‍යයේ දළ නිල සංචිත අඩු විය...

ගෙවුම් තුලනය



ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනසට සමාන වන සමස්ත ශේෂය, 2019 වසරේ දී වාර්තා කළ අතිරික්තයට සාපේක්ෂව 2020 වසරේ දී හිඟයක් වාර්තා කළේය.

දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්



දළ නිල සංචිත

2020 : එ.ජ. ඩොලර් බිලියන 5.7 (ආනයනික මාස 4.2)

2019 : එ.ජ. ඩොලර් බිලියන 7.6 (ආනයනික මාස 4.6)

ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය 2020 වසරේ දී අඩු විය...

විදේශීය ණය



මුළු විදේශීය ණය තත්ත්වය

2020 වසර අවසානය වන විට: එ.ජ. ඩොලර් බිලියන 49.2 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 60.9%)

2019 වසර අවසානය වන විට: එ.ජ. ඩොලර් බිලියන 54.8 (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 65.3%)

විදේශීය ණය සේවාකරණ ගෙවීම්

2020 : එ.ජ. ඩොලර් බිලියන 4.4

2019 : එ.ජ. ඩොලර් බිලියන 5.8

2020 වසරේ දී විදේශීය ණය පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ

- 2020 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී කල්පිරුණු එ. ජ. ඩොලර් බිලියන 1ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් පියවීම
- රජය ලබාගත් ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩු වීම
- රුපියල්වලින් නාමනය කර ඇති රාජ්‍ය සුරැකුම්පත්වල අනේවාසිකයින් සතු ආයෝජන පහළ යෑම
- ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නේවාසිකයින් සතු ආයෝජන ඉහළ යෑම
- ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීම

විදේශීය මූල්‍යකරණ එක්රැස් කිරීමේ අභියෝග හමුවේ වුවද, ශ්‍රී ලංකාව ණය සේවාකරණය කිරීම පිළිබඳ වූ නොබිඳුණු වාර්තාව තවදුරටත් පවත්වාගෙන ගියේය...

2020 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අවප්‍රමාණය සියයට 2.6කට සීමා විය...

- 2020 වසරේ මාර්තු මස සිට අප්‍රේල් මස දක්වා කාලය තුළ සහ 2020 වසරේ අග භාගයේදී පැවති පීඩන හමුවේ වුව ද, විනිමය අනුපාතිකයේ පැවති සැලකිය යුතු විචලනයන් කාලෝචිත ක්‍රියාමාර්ග තුළින් වළක්වන ලදී.
- සමස්තයක් ලෙස, 2020 වසර තුළ ශුද්ධ පදනම මත දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය අවශෝෂණය කර ඇත. (එ.ජ. ඩොලර් මිලියන 283)
- රටෙහි වෙළඳ තරගකාරීත්වය පෙන්නුම් කරමින් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක පදනම් වර්ෂයේ (2017=100) සීමාවට වඩා අඩු අගයක පැවතුණි.

විනිමය අනුපාතිකය හා දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) මුදල් වර්ග 24 පැස අනුව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු

2020 වසර ආරම්භ වන විට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් මන්දගාමීව පැවති ආර්ථිකයට සහාය සැපයීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබිණි. කෙසේ වෙතත්, වසංගතයේ බලපෑම හේතුවෙන් 2020 වසර තුළ දී රාජ්‍ය මූල්‍ය කටයුතු සැලකිය යුතු අභියෝගයන්ට මුහුණ දුන් අතර, සමස්ත රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය අපේක්ෂා කළ මට්ටමට වඩා දුර්වල විය...

විවිධ අභියෝග මධ්‍යයේ වුව ද, ආර්ථික ක්‍රියාකාරකම් කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීම සහ ආර්ථිකය ඉහළ වර්ධන මාවතක් කරා යොමු කිරීම තහවුරු කිරීම සඳහා, වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයින් හට රජය අඛණ්ඩව සහාය විය...

- වසංගතය මධ්‍යයේ 2020 වසර තුළ දී මුහුණ දුන් සැලකිය යුතු අභියෝග හේතුවෙන් ආදායම් රැස් කිරීම අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පැවති අතර, පුනරාවර්තන වියදම් ඉහළ ගියේය.

රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය (දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලය: මුදල් අමාත්‍යාංශය

- **රාජ්‍ය මූල්‍ය කටයුතු මත වන ඉහළ පීඩනය පිළිබිඹු කරමින්, 2020 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ පසුබෑමකට ලක් වූ අතර, එමගින් 2020 වසර අවසානය වන විට මධ්‍යම රජයේ නොපියවූ ණය ඉහළ ගියේය.**



බදු ආදායම සැලකිය යුතු ලෙස පහත වැටීම පිළිබිඹු කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, බදු ආදායම 2019 වසරේ දී පැවති සියයට 12.6 සිට 2020 වසරේ දී සියයට 9.1 දක්වා අඩු විය...

- මෙම ප්‍රතිඵලයට හේතු වූයේ ආර්ථික කටයුතු සංකෝචනය වීම නිසා ආදායම් ලැබීමේ මාර්ග දුර්වල වීම මෙන්ම, 2019 වසර අවසන් භාගයේ සිට බදු සංශෝධන හරහා ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය මූල්‍ය උත්තේජන ක්‍රියාමාර්ගයි

රාජ්‍ය ආදායමේ සංයුතිය - 2020



මූලය: මුදල් අමාත්‍යාංශය

රාජ්‍ය ආදායම පිළිබඳ සම්පිණ්ඩනය

ශීර්ෂය	2019 (අ)	2020 (ආ)
රුපියල් මිලියන		
බදු ආදායම	1,734,925	1,216,542
ආදායම් බදු	427,700	268,249
එකතු කළ අගය මත බදු	443,877	233,786
නිෂ්පාදන/සුරා බදු	399,478	321,932
ආනයන මත බදු	98,427	114,183
අනෙකුත් බදු	365,443	278,392
බදු නොවන ආදායම	155,974	151,417
මුළු ආදායම	1,890,899	1,367,960
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ)		
බදු ආදායම	11.6	8.1
ආදායම් බදු	2.8	1.8
එකතු කළ අගය මත බදු	3.0	1.6
නිෂ්පාදන/සුරා බදු	2.7	2.2
ආනයන මත බදු	0.7	0.8
අනෙකුත් බදු	2.4	1.9
බදු නොවන ආදායම	1.0	1.0
මුළු ආදායම	12.6	9.1

මූලය: මුදල් අමාත්‍යාංශය

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) 2019 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

ප්‍රාග්ධන වියදම් කැපී පෙනෙන ලෙස පහත වැටීම හේතුවෙන් මුළු වියදම සහ ශුද්ධ ණය දීම් පහළ ගියේය...

- වියදම් අංශය සැලකූ විට, රුපියල් බිලියන 422.6ක් වූ නොපියවූ හිඟ මුදල් ගෙවීම හා සම්බන්ධ වියදම 2020 වසරේ සිට 2019 වසරට විතැන් කරමින් මුදල් අමාත්‍යාංශය රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා ලේඛනවලට ගැළපුමක් සිදු කළේය.
- ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී සියයට 22.2ක් වූ මුළු වියදම් සහ ශුද්ධ ණය දීම් 2020 වසරේ දී සියයට 20.3ක අගයක් වාර්තා කළේය.
  - ප්‍රධාන වශයෙන් වැටුප් හා වේතන, සහනාධාර හා පැවරුම් මෙන්ම, පොලී ගෙවීම් සඳහා දැරීමට සිදු වූ වියදම් ඉහළ යෑම හේතුවෙන්, 2019 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 16.1ක් වූ පුනරාවර්තන වියදම්, 2020 වසරේ දී සියයට 17.0ක් දක්වා ඉහළ ගියේය.
  - ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම් 2019 වසරේ වාර්තා වූ සියයට 6.1ට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 3.3ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය.

රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2020 (අ)



(අ) 2020 වසරේ සිට 2019 වසරට විතැන් කරන ලද පුනරාවර්තන වියදම්වල නොපියවූ ගෙවීම්වලට අදාළ ගැලපීම්, සමස්ත පුනරාවර්තන වියදම්වල ප්‍රතිශතයක් ලෙස එහි සාපේක්ෂ කොටස් ගණනය කිරීමේ දී ඇතුළත් කර නොමැත.

මූලය: මුදල් අමාත්‍යාංශය

1950-2020 Stability Sustainability Shared Prosperity

2020 වසරේ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ සැලකිය යුතු ලෙස පහත වැටීම සඳහා වසංගතයේ බලපෑම් හේතු විය...

- නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම්වලට පසු, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය 2019 වසරට අදාළ වූ සියයට 9.6 සිට 2020 වසරේ දී සියයට 11.1ක් දක්වා ඉහළ ගියේය.
- වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසරේ දී වාර්තා වූ සියයට 3.6 සිට 2020 වසරේ දී සියයට 7.9ක් දක්වා වැඩි විය.
- ප්‍රාථමික ශේෂයේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2019 වසරේ දී වාර්තා කළ සියයට 3.6ට සාපේක්ෂව, 2020 වසරේ දී සියයට 4.6ක් වාර්තා කළේය.

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



(ඇ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.

මූලය: මුදල් අමාත්‍යාංශය

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



2020 වසරේ දී අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා දේශීය ප්‍රභවයන් යොදා ගන්නා ලදී...

- වසර තුළ නොපියවූ ණය තොගය ඉහළ යෑම මෙන්ම දළ දේශීය නිෂ්පාදිතය සංකෝචනය වීමෙහි ඒකාබද්ධ බලපෑම පිළිබිඹු කරමින්, නොපියවූ මධ්‍යම රජයේ ණය ප්‍රමාණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2019 වසර අවසානයට පැවති සියයට 86.8ට සාපේක්ෂව, 2020 වසර අවසන් වන විට සියයට 101.0 දක්වා ඉහළ නැගුණි.



- මුළු ණය ප්‍රමාණයට සාපේක්ෂව විදේශීය ණය ප්‍රමාණය 2019 වසර අවසානයේ දී පැවති සියයට 47.6ක සිට 2020 වසර අවසානය වන විට සියයට 40.0ක් දක්වා පහත වැටුණි
- විදේශීය මූලාශ්‍රවලට වඩා දේශීය මූලාශ්‍ර ඔස්සේ අයවැය මූල්‍යනය කිරීමට රජය යොමු වීම මෙන්ම, අහිතකර ගෝලීය වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයේ විදේශීය මූල්‍යනය සඳහා වූ සීමිත ප්‍රවේශය මෙයින් පිළිබිඹු විය.



අහිතකර වෙළඳපොළ සමපේක්ෂණයන් මධ්‍යයේ වුව ද, රජය, සිය ණය සේවාකරණය සම්බන්ධයෙන් මෙතෙක් පවත්වා ගන්නා ලද නොබිඳුණු වාර්තාව අඛණ්ඩව පවත්වා ගැනීමට කටයුතු කළේය...

මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

අරමුදල් පිරිවැය අඩු කිරීම, මුදල් වෙළඳපොළ තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පැවතීම තහවුරු කිරීම, සහ වසංගතය මගින් නිර්මාණය කරන ලද අභියෝගාත්මක තත්ත්වයන් යටතේ මූල්‍ය පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වයක් තහවුරු කිරීම අරමුණු කරගනිමින් මහ බැංකුව විසින් 2020 වසර තුළ දී අතිශයින්ම ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවන ලදී...

අඩු උද්ධමන තත්ත්වයත් සමඟ වසංගතයේ බලපෑම්වලින් යථා තත්ත්වයට පත්වීම සහ ආර්ථික වර්ධන වේගය නැවත ළඟා කර ගැනීම සඳහා ආර්ථිකයට සහාය දැක්වීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසර තුළ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ලිහිල් කළේය...

නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සහ බැංකු අනුපාතිකය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 250කින් අඩු කරන ලද අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 3කින් අඩු කරන ලදී
- බැංකු අනුපාතිකය, පදනම් අංක +300ක ආන්තිකයක් සහිතව, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීමට ඉඩ සලසන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එය 2020 වසරේ දී පදනම් අංක 650කින් අඩු විය
- සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යටතේ සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වා දෙන ලදී

- ඉතා ඉහළ පොලී අනුපාතික පහළ දැමීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළේය
- දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා වසරකට සියයට 7ක උපරිම පොලී අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී
- බැංකු සඳහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි ප්‍රමුඛ අංශවලට ණය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දීමට තීරණය කරන ලදී

- වසංගතය මධ්‍යයේ රජයේ මුදල් ප්‍රවාහ ලැබීම්හි පැවති දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව රජයට අවශ්‍ය මූල්‍යමය සහාය ලබා දුන්නේය

ශ්‍රී ලංකා මහ බැංකුව 2020 වසරේ දී උපයෝගී කර ගත් මුදල් ප්‍රතිපත්ති උපකරණ පිළිබඳව විශේෂ සටහනක් මඟින් තවදුරටත් සාකච්ඡා කර ඇත...

1950-2020 Stability Sustainability Shared Prosperity

මෙම ප්‍රතිපත්තිමය, මෙහෙයුම් සහ නියාමන ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, සමස්ත වෙළඳපොළ ණය අනුපාතික ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම දක්වා පහත වැටුණි...

තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකයන්ගේ හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

පොලී අනුපාතික වෙනස්වීම්

පොලී අනුපාතිකය	2020 අවසානයට	2019 අවසානයේ සිට 2020 අවසානය දක්වා
	ප්‍රතිශතයක් ලෙස	*පදනම් අංකවල වෙනස*
මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය	5.74	-426
බරිත සාමාන්‍ය ණය අනුපාතිකය	10.29	-330
බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය	8.38	-442
බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය	4.55	-290
දින 91 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකය	4.69	-282
දින 182 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකය	4.80	-322
දින 364 භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකය	5.05	-340
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය	5.80	-240
බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය	7.14	-291
බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය	4.93	-396
බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය	5.08	-409

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය ක්‍රමයෙන් ඉහළ යෑමක් 2020 වසරේ අග භාගය වන විට නිරීක්ෂණය විය...

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **2020 වසර අවසානය වන විට පෞද්ගලික අංශයට ලබා දුන් ණය සියයට 6.5ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් වසර තුළ දී රුපියල් බිලියන 374.1කින් ඉහළ ගියේය**

ප්‍රධාන අංශවලට ලබා දුන් පෞද්ගලික අංශයේ ණයවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (සියයට)

පෞද්ගලික ණය සහ අත්තිකාරම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු වෙමින්, 2020 වසරේ දෙවන භාගයේ දී පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ඉහළ ගියේය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මහ බැංකුව විසින් සිදු කරන ලද නව සමීක්ෂණයක් මගින් මනිනු ලබන පොලී අනුපාතිකවල හැසිරීම සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ණය පිළිබඳව, විශේෂ සටහනක් මගින් විස්තර කර ඇත.

2020 වසර තුළ දී බැංකු අංශය මගින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය...

දේශීය ණයෙහි වාර්ෂික ඉහළ යෑම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසංගතය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතා මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය කටයුතු පවත්වාගෙන යෑම සඳහා මහ බැංකුව සහ බැංකු අංශය රජයට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීය

රාජ්‍ය අංශය වෙත ලබා දුන් ණය ප්‍රසාරණය (වාර්ෂික වෙනස, රුපියල් බිලියන)

	රජය වෙත ලබා දුන් ශුද්ධ ණය	රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය
2019	279	63
2020	1,752	184



බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහත වැටීම මධ්‍යයේ දේශීය ණය වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස පුළුල් මුදල් සැපයුම ශීඝ්‍ර ලෙස ප්‍රසාරණය විය...

පුළුල් මුදල්වල (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සඳහා තුඩු දුන් සාධක (වත්කම් අනුව)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1950-2020 Stability Sustainability Shared Prosperity

මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායීතාව

වසංගතය හේතුවෙන් ආර්ථිකයට අවශ්‍යවන සුවිශේෂී සහාය සැපයීම සඳහා මූල්‍ය අංශය සවිබල ගන්වන අතර ම, මූල්‍ය ආයතනවල අභිප්‍රායයන් සුරක්ෂිත කිරීම මෙන්ම එම ආයතනවල තැන්පතුකරුවන් ආරක්ෂා කරගැනිම ඉලක්ක කර ගනිමින් විවිධ ක්‍රියාමාර්ග හඳුන්වාදීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය පද්ධතියෙහි ස්ථායීතාව පවත්වා ගැනීම තහවුරු කරන ලදී.

2020 වසර තුළ දී බැංකු අංශය මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය ...

- වසංගතයේ බලපෑම් හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක ආර්ථික පරිසරයෙන් මතුවන අවදානම් මධ්‍යයේ වුවද, බැංකු අංශය මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය

- වසංගතය හමුවේ මතු වූ ගැටලු හේතුවෙන් ණයවල ගුණාත්මකභාවය පිරිහීම සහ විදේශ විනිමය ගලා ඒම මධ්‍යස්ථ වීම බැංකු අංශයේ මෙහෙයුම් හා සම්බන්ධ ප්‍රධාන සාර්ව විචක්ෂණශීලී ගැටලු විය

බැංකු අංශයේ ලාභදායිත්ව දර්ශක



ණය හා අත්තිකාරම්, ආයෝජන සහ තැන්පතු පදනම් අනුව බැංකු අංශය සතුටුදායක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

↑ 11.9 ණය සහ අත්තිකාරම්වල වාර්ෂික වර්ධනය (%)

↑ 40.0 ආයෝජනවල වාර්ෂික වර්ධනය (%)

↑ 21.6 තැන්පතුවල වාර්ෂික වර්ධනය (%)

↑ 4.9 දළ අක්‍රීය ණය අනුපාතය (%)

↑ 37.3 ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය - දේශීය බැංකු මෙහෙයුම් අංශය (%)

↓ 16.5 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%)

COVID - 19 වසංගතයෙන් පැන නගින ලද අභියෝග මධ්‍යයේ වුව ද බැංකු අංශය 2020 වසර තුළ දී ශක්තිමත්ව පැවතිණි.

බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය 2020 වසර තුළ දී පසුබෑමට ලක් විය...

- **ප්‍රධාන වශයෙන් වසංගත ආශ්‍රිත බාධාවන් සහ මහජන විශ්වාසය පහත වැටීම හේතුවෙන් වත්කම් පදනමේ අඩුවීම, ණය සහ තැන්පතු සහ ලාභදායිතාවය සහ වසර තුළ අක්‍රීය ණය වැඩිවීම තුළින් බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයෙහි මන්දගාමී කාර්යසාධනය පිළිබිඹු විය**

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ලාභදායිත්ව දර්ශක



බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අක්‍රීය ණය පහසුකම් සහ වෙන්කිරීම් ආවරණයන්



- **කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයින්ට සහන සැලසීම සඳහා මූල්‍ය පද්ධතිය සවිබල ගන්වන අතර, ඉහත ප්‍රතිඵල මගින් බැංකු අංශයට, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට ඇති අහිතකර බලපෑම කළමනාකරණය කිරීමේ අරමුණින් යුතුව මහ බැංකුව නියාමන සහන ගණනාවක් ලබා දුන්නේය.**

වසංගතය ආරම්භයේදී විශාල පසුබෑමක් වාර්තා කළ කොළඹ කොටස් හුවමාරුව ඉන් අනතුරුව යථා තත්ත්වයට පත්වෙමින් 2020 ජූලි මස මැද භාගයේ සිට සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය...

- **2020 වසර තුළ දී ශුද්ධ විදේශ ආයෝජන පිටතට ගලා යෑමක් වර්තා කළ ද, කොටස් ආයෝජනය සඳහා දේශීය ආයෝජකයින්ගේ රුචිය ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය.**

මිල දර්ශක සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණයෙහි හැසිරීම



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

කොටස් වෙළඳපොළෙහි විදේශ සහභාගීත්වය



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

මැදි කාලීන සාර්ව
ආර්ථික දැක්ම

මැදි කාලීන සාර්ව ආර්ථික දැක්ම(අ)

දර්ශකය	ඒකකය	2019 (ආ)	2020 (ඇ)	පුරෝකථන				
				2021	2022	2023	2024	2025
මූර්ත අංශය (ඈ)								
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	2.3 (ඇ)	-3.6	6.0	5.2	5.8	6.5	7.0
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් ට්‍රිලියන	15.0 (ඇ)	15.0	16.6	18.4	20.7	23.2	26.1
ඒක පුද්ගල ද.දේ.නි.	එ.ජ. ඩොලර්	3,852 (ඇ)(ඉ)	3,682	3,873	4,092	4,420	4,784	5,178
මුළු ආයෝජන	ද.දේ.නි.යේ % වශයෙන්	26.8 (ඇ)(ඊ)	25.2	27.5	28.0	28.5	29.0	29.5
දේශීය ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	20.7 (ඇ)(ඊ)	18.9	23.1	24.6	26.2	27.4	28.5
ජාතික ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	24.7 (ඇ)(ඊ)	23.9	27.3	28.2	29.0	29.8	30.5
විදේශීය අංශය								
වෙළඳ ශේෂය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-9.5	-7.4	-6.2	-5.5	-4.6	-3.7	-3.5
අපනයන	එ.ජ. ඩොලර් බිලියන	11.9	10.0	12.5	14.0	15.5	17.0	18.9
ආනයන	එ.ජ. ඩොලර් බිලියන	19.9	16.1	17.8	19.0	20.0	21.0	23.0
ජංගම ගිණුමේ ශේෂය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-2.2	-1.3	-0.2	0.2	0.5	0.8	1.0
විදේශීය නිල සංචිත	ආනයනික මාස වශයෙන්	4.6	4.2	3.2	3.7	4.3	4.7	5.0
රාජ්‍ය මූල්‍ය අංශය (ඈ) (උ)								
සමස්ත ආදායම් සහ ප්‍රදාන	ද.දේ.නි.යේ % වශයෙන්	12.6 (ඌ)(එ)	9.2	11.8	13.0	13.5	14.3	15.1
වියදම් හා ශුද්ධ ණය දීම	ද.දේ.නි.යේ % වශයෙන්	22.2 (ඌ)(එ)	20.3	21.2	20.4	19.1	19.0	19.2
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-3.6 (ඌ)(එ)	-7.9	-3.1	-1.3	0.0	1.2	2.3
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-3.6 (ඌ)(එ)	-4.6	-4.2	-2.3	-0.6	0.2	0.9
සමස්ත අයවැය හිඟය	ද.දේ.නි.යේ % වශයෙන්	-9.6 (ඌ)(එ)	-11.1	-9.4	-7.5	-5.6	-4.7	-4.0
මධ්‍යම රජයේ ණය	ද.දේ.නි.යේ % වශයෙන්	86.8 (ඌ)	101.0	98.0	95.0	91.0	86.0	80.0
මුදල් අංශය සහ උද්ධමනය								
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඒ)	සියයට	7.0	23.4	21.0	12.5	12.5	12.5	12.5
පෞද්ගලික අංශයට ලබාදුන් ණය								
වර්ධනය (M_{2b} හි) (ඒ)	සියයට	4.2	6.5	12.2	11.6	11.7	12.0	12.0
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (ඔ)	සියයට	4.3	4.6	4.3	5.8	6.0	5.5	5.0

(අ) මුද්‍රණයට යන අවස්ථාව දක්වා පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) 2019 වසර සඳහා ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින්, 27.4%, 21.3% සහ 25.3%ක් වූ මුළු ආයෝජන, දේශිය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී.
(උ) රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ පුරෝකථන මුදල් අමාත්‍යාංශයෙහි දත්ත මත පදනම් වේ.
(ඌ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද 2019 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(එ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(ඒ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය.
(ඔ) කො.පා.මි. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සාර්ව ආර්ථික දැක්ම සඳහා වන අවදානම්...

ශ්‍රී ලංකාව තුළ දෛනිකව වාර්තා වන කොවිඩ්-19 වැළඳුණු රෝගීන් සංඛ්‍යාව



- **2020 වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති මැදි කාලීන දැක්ම 2021 වසරේ අප්‍රේල් මස මැද භාගයේ දී පුරෝකථනය කර අවසන් කෙරිණි.**
- **කෙසේ වෙතත්, එතැන් සිට කොවිඩ්-19 වසංගතය පැතිරීම විශාල වශයෙන් ඉහළ ගොස් ඇති අතර, පුරෝකථනවලට බලපාන අවිනිශ්චිතතා තවදුරටත් පවතින බව පෙන්නුම් කරයි.**
- **එබැවින්, වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති දැක්ම ඉදිරි කාල සීමාව තුළ දී සංශෝධනය විය හැකිය.**

තවද, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මැද භාගයේ දී ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වසර වෙනස් කර ප්‍රකාශයට පත් කිරීමට නියමිතය. 2015 වසර නව පදනම් වසර වන බැවින්, එසේ පදනම් වසර වෙනස් කිරීම හේතුවෙන් 2015 වසරේ සිට ජාතික ගිණුම් සහ ඒ හා සම්බන්ධ අනුපාතික නැවත නිර්වචනය කිරීම අවශ්‍ය වනු ඇත.

1950-2020 Stability Sustainability Shared Prosperity 70

වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික දැක්ම...

- ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ දී වේගවත් ලෙස යථා තත්ත්වයට පත්වනු ඇතැයි ද, ආර්ථික වර්ධනය මූලික කරගත් ප්‍රතිපත්තිමය සහයෝගය තුළින් මැදි කාලීනව ඉහළ වර්ධන වේගයක් පවත්වා ගෙන යනු ඇතැයිද අපේක්ෂා කෙරේ
    - මුදල් සහ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට පමණක් ආර්ථික පුනර්ජීවනය හා වර්ධන වේගය නැවත ළඟාකර ගැනීම කළ නොහැක
    - මේ සඳහා රජය විසින් ගනු ලබන පුළුල් පරාසයක වූ ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍යය වේ
- සාර්ව ආර්ථික ස්ථායීතාව පවත්වා ගැනීම සඳහා නුදුරු අනාගතයේ විදේශීය අංශය මත ඇති වන පීඩන සුපරීක්ෂාකාරීව කළමනාකරණය කිරීම ඉතා වැදගත් වන අතරම, ණය බර ඇති නොකරන විදේශ විනිමය ලැබීම් ආකර්ෂණය කර ගැනීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තුළින් මැදි කාලීනව මෙම අංශයෙහි අභියෝග සඳහා මුහුණ දීමට ඇති හැකියාව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ
- රජයේ ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයට අනුකූලව, ආර්ථික ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වර්ධනයෙහි බලපෑම තුළින් රාජ්‍ය මූල්‍ය අංශය මැදි කාලීනව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ
- සමස්ත ඉල්ලුම යථා තත්ත්වයට පත්වන විට අතිරික්ත ප්‍රතිපත්ති උත්තේජනයන් කාලානුරූපීව අඩු කරගැනීම සඳහා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමත් සමඟ උද්ධමනය මැදි කාලීනව ඉලක්කගත පරාසය තුළ පවත්වා ගැනෙනු ඇතැයි අපේක්ෂා කෙරේ
- අපේක්ෂිත පරිදි අඩු උද්ධමන වාතාවරණයක් පවත්වා ගැනීම, අඩු පොලී අනුපාතික ව්‍යූහය පවත්වාගෙන යෑම සඳහා උපකාරී වනු ඇති අතර, ඉතිරි කරන්නන් හට ප්‍රමාණවත් මූර්ත ප්‍රතිලාභ ලබා දෙන අතරම, අඩු පිරිවැයකින් පෞද්ගලික අංශය වෙත වන ණය සැපයුමට පහසුකම් සලසමින් අපේක්ෂිත පරිදි ආර්ථික වර්ධනය ඉහළ නංවා ගැනීමට සහාය සැලසෙනු ඇත

ගැටලු සහ ප්‍රතිපත්ති

ගැටලු සහ ප්‍රතිපත්ති...

01 **ඵලදායිතාවයේ මන්දගාමී ප්‍රගමනය** ශ්‍රී ලංකාවේ තිරසාර ආර්ථික වර්ධනයක් අත් කර ගැනීම සඳහා ප්‍රධාන අභියෝගයක්ව පවතී.

02 අපනයන අංශය පුනර්ජීවනය කිරීම සඳහා සහ දීර්ඝ කාලීනව පවත්නා ගැටලු පිළිබඳ අවධානය යොමු කරමින් **කලක සිට කළ යුතුව තිබූ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම** සඳහා පියවර ගන්නා අතරතුර, **හඳුනාගත් අපනයන අංශ ප්‍රවර්ධනයට ප්‍රමුඛතාව ලබා දීම** ඉතා වැදගත් වේ.

03 සේවා අපනයනයන්හි භාවිතයට නොගත් විභවතාවන් ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින් **සේවා අපනයනය වැඩි දියුණු කිරීම**, ශ්‍රී ලංකාවේ විදේශීය ජංගම ගිණුම වෙත ලැබීම් වර්ධනය කිරීම සඳහා හේතු වන ප්‍රමුඛ උපාය මාර්ගයක් වේ.

04 කොවිඩ්-19 වසංගතය හමුවේ නිර්මාණය වූ **නව සාමාන්‍ය තත්ත්වය යටතේ සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වාගෙන** යෑම සඳහා විදේශීය මෙන්ම දේශීය සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා සංචාරක අංශය තුළ **නව්‍ය උපායමාර්ග** ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

05 **කොළඹ වරාය නගරය** යනු දකුණු ආසියාවේ ඇති එම වර්ගයේ පළමු ව්‍යාපෘතිය වන අතර, ආයෝජකයින්ට හිතකර වාතාවරණයක් කඩිනමින් ලබා දීම තුළින් **උපායමාර්ගික ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා රටෙහි ඇති හැකියාව** මත එමගින් **සමාජ ආර්ථික ප්‍රතිලාභ රාශියක්** රටට අත්කර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ගැටලු සහ ප්‍රතිපත්ති...

06 සැලකිය යුතු ප්‍රමාණයක **විදේශීය සෘජු ආයෝජන වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීමට රට අඛණ්ඩව අසමත් වීම** තුළින්, **දිගු කාලීන දැක්මක් සහිතව ස්ථාවර ප්‍රතිපත්ති රාමුවක්** පවත්වා ගෙන යන අතරම, ව්‍යුහාත්මක, ආයතනික සහ ප්‍රතිපත්තිමය බාධාවන්වලට **පිළියම් යෙදීමේ ඇති වැදගත්කම** පෙන්වා දෙයි.

07 සාර්ව ආර්ථික ස්ථායීතාවය තහවුරු කිරීමට සහ දිගු කාලීන ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට ඇති බාධා වැළැක්වීම සඳහා, **විදේශීය ණයෙහි ප්‍රසාරණය** අඩු කර ගත යුතුව ඇති අතර, ඒ සඳහා **දේශීය ජංගම ගිණුමේ ශේෂය සහ රාජ්‍ය මූල්‍ය ශේෂය වැඩි දියුණු කිරීම** අවශ්‍ය වේ.

08 රජය විසින් ක්‍රියාමාර්ග ගත යුතුව පවතින **ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අභියෝග** ලෙස රාජ්‍ය ආදායම දිගින් දිගටම අඩු මට්ටමක පැවතීම, පුනරාවර්තන වියදම අඩු කිරීමට අපහසු වීම, අයවැය හිඟයයන් මූල්‍යනය කිරීමේ අවශ්‍යතා ඉහළ යෑම සහ ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ණය මට්ටම ඉහළ යෑම මෙන්ම රාජ්‍ය ව්‍යවසායයන්ගේ මූල්‍ය කාර්ය සාධනය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාව සඳහන් කළ හැකිය.

09 ඉදිරි කාලය තුළ දී **ප්‍රතිපත්ති සකස් කරන විට**, **කොවිඩ්-19 වසංගතය මගින් ජනගහනයේ අඩු වරප්‍රසාදිත කොටස් කෙරෙහි විෂමානුපාතික බලපෑමක්** එල්ල කර ඇති බව සහ ආදායම් සම්බන්ධයෙන් පමණක් නොව, කෙටි කාලීනව සමාජ ආර්ථික යහපැවැත්මට හා දිගු කාලීනව ඵලදායීතාවට බලපාන අනෙකුත් පැතිකඩවලට සම්බන්ධ විෂමතා ද උග්‍ර කර ඇති බව **නිසි අවධානයට ලක් කළ යුතුය**.

ගැටලු සහ ප්‍රතිපත්ති...

10 කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් ආර්ථික වර්ධනය වේගවත් කරන අතරතුර ආහාර සුරක්ෂිතතා ගැටලු විසඳීම සහ විදේශීය අංශයේ පීඩනයන් ලිහිල් කිරීම සඳහා **ශ්‍රී ලංකාවේ ආහාර ස්වයංපෝෂිතභාවය ඉහළ නැංවීම** අතිශය වැදගත්වේ.

11 ඉහළ ආදායම් ලබන ආර්ථිකයක් බවට රට පත්කිරීම සඳහා දායක විය හැකි පරිදි, **කම්පනවලට ඔරොත්තු දෙන සහ අවශ්‍ය පරිදි වෙනස්වන ගතික ශ්‍රම බලකායක්**, නිර්මාණය කිරීම සඳහා **කඩිනම් ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවලට** යොමු වීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් **ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ඇති අස්ථාවරතා සහ එය මුහුණ දෙන අවදානම් තත්ත්වයන්** කොවිඩ්-19 වසංගතය මගින් ඉස්මතු කර දැක්වීය.

12 **සමාජයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි සහ තිරසාරාත්මක වර්ධනයක් උදා කිරීම සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර** අතිශය වැදගත් බවට පුළුල් පිළිගැනීමක් ඇති අතර, එමගින් මෙම අංශය නගා සිටුවීම සඳහා සුවිශේෂී ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සැලසුම් කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරෙයි.

13 දැනට පවත්නා අඩු උද්ධමන, අඩු පොලී අනුපාතික පරිසරය තුළ ආර්ථිකයේ ඇති වන අවශ්‍යතා සපුරාලීම සඳහා **ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය ශීඝ්‍ර වෙනස්වීමකට ලක් වීම** අවශ්‍ය වේ.

ගැටලු සහ ප්‍රතිපත්ති...

14 රටේ පොලී අනුපාතික ව්‍යුහය තනි ඉලක්කමක මට්ටමේ පවතිනු ඇතැයි අපේක්ෂා කරන බැවින්, **විවිධ විශ්වාස කළ නොහැකි පාර්ශ්ව විසින් ප්‍රවර්ධනය කරනු ලබන දීමනා සහ අවස්ථා පිළිබඳව මහජනතාව වඩාත් සුපරීක්ෂාකාරී විය යුතුය.**

15 වසංගතය විසින් ඇති කරන ලද අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ **ඩිජිටල් ගෙවුම් ක්‍රම** භාවිතය ඉහළ ගිය ද, **ශීඝ්‍රයෙන් වැඩි දියුණු වන තාක්ෂණය සඳහා මූල්‍ය අංශයේ පාර්ශ්වකරුවන්ගේ සූදානම** සහ තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා මහජනතාව අතර **මූල්‍ය සාක්ෂරතාවය වැඩිදියුණු කිරීම** අවශ්‍ය වේ.

16 **ශ්‍රී ලංකාව තුළ පාරිසරික ගැටලු** මගින් සාර්ව ආර්ථිකයට ඇති කරනු ලබන සැලකිය යුතු බලපෑම ක්‍රමයෙන් ඉහළ යෑම මගින් තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති රාමුවක ඇති වැදගත්කම වඩාත් තහවුරු කෙරේ.

17 **නිවැරදි සහ නියමිත කාලයට නිකුත් වන දත්ත, තොරතුරු පදනම් කර ගත් සමාජයන්හි ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.**

විශේෂ සටහන්

වි.ස.1 කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව

- කොවිඩ්-19 වසංගත කාලපරිච්ඡේදය තුළ තීව්‍ර වූ ආර්ථික හා සමාජීය ගැටලු රැස අතරින්, ආහාර සුරක්ෂිතතාවට අදාළ ගැටලු පිළිබඳව දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් ද ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ, විද්වතුන්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ඉහළ අවධානයක් යොමු වී ඇත.
- වසංගත කාලපරිච්ඡේදය තුළ දී ආහාර නිෂ්පාදනය අඛණ්ඩව සිදු කිරීම හා බෙදා හැරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබුව ද, ගෝලීය හා දේශීය වශයෙන් ක්‍රියාත්මක වූ ආර්ථික හා සමාජ කටයුතු සීමා කර තැබීම් සහ සංචරණ සීමා පැනවීම් වැනි පෙර නොවූ විරූ වසංගත නිවාරණ පියවර සමඟ රටේ ආර්ථික කටයුතු කෙරෙහි අවහිරතා ඇති වූ අතර, ඒ හේතුවෙන් සැපයුම් දාම සහ ජනතාවගේ ජීවනෝපායන් කෙරෙහි මෙන්ම, එමගින් ආහාර සුරක්ෂිතතාවට ද බලපෑම් එල්ල විය.

කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අනුගමනය කළ ප්‍රතිපත්ති

- සමාජ ආරක්ෂණ වැඩසටහන් පුළුල් කිරීම
- ඉලක්කගත පෝෂණ ආධාරක වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගෙන යෑම
- සැපයුම් දාමයේ පාර්ශ්වකරුවන්ට නොසැලී සිටීම සඳහා හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම පිණිස පහසුකම් සැපයීම
- රජය විසින් ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සහ මහජනයා අතර ඒවා බෙදා හැරීම
- දේශීය කෘෂිකර්මාන්තය දිරිමත් කිරීම
- ආහාර සැපයුම් දාමයට සහභාගීවන්නන් විසින් සෞඛ්‍ය හා ආරක්ෂණ රෙගුලාසි දැඩි ලෙස පිළිපැදීම

ඉදිරි දැක්ම

- කෘෂිකාර්මික අංශයේ ඵලදායිතා මට්ටම් වැඩිදියුණු කිරීම
- අලෙවිකරණය හා ආහාර බෙදා හැරීමේ ක්‍රම වැඩිදියුණු කිරීම
- ආහාර නිෂ්පාදන දත්ත ගොනු පිහිටුවීම හා රාජ්‍ය අංශයේ බෙදා හැරීමේ මාර්ග ශක්තිමත් කිරීම
- ශීතාගාර ද ඇතුළුව ගබඩාකරණ පහසුකම් සහ ප්‍රවාහන සේවා වැඩිදියුණු කිරීම
- ආර්ථික වශයෙන් අවදානමට ලක්විය හැකි පුද්ගල කණ්ඩායම්වලට ආදායම් උත්පාදනය කිරීමේ අවස්ථා ඇති කිරීම
- සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු සහ සෞඛ්‍ය සම්පන්න ආහාර තේරීම් ප්‍රවර්ධනය කිරීම සඳහා පෝෂණය හා ආහාර සුරක්ෂිතතාව පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම

වැඩි දියුණු වූ ගෝලීය ශ්‍රේණිගත කිරීම්: ආයෝජක ආකර්ෂණය උදෙසා මූලික වේ

අඛණ්ඩව පවත්නා ඉතුරුම්-ආයෝජන පරතරය මධ්‍යයයේ, ප්‍රමාණවත් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අසමත් වීම සංවර්ධන වෙත වූ ශ්‍රී ලංකාවේ ගමන් මගෙහි වේගය අඩාල කරන ප්‍රධාන බාධකයක් බවට පත්ව ඇත.

- ආයෝජකයින්ගේ ආකර්ෂණය වර්ධනය සඳහා තෝරාගත් ගෝලීය දර්ශකවල නවතම ශ්‍රේණිගත කිරීම්වල දැක්වෙන පරිදි ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් ප්‍රමුඛතා අංශ ලෙස හඳුනාගත හැකිය
- පහත දර්ශකවල වැඩිදියුණුවක් ළඟා කර ගැනීම මගින් තරගකාරිත්වය නැවත ස්ථාපිත කළ හැකිය
  - ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පහසුව පිළිබඳ දර්ශකය
  - ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකය
  - දූෂණ සංජානන දර්ශකය

- කොළඹ වරාය නගර කොමිසම ස්ථාපිත කිරීම මගින් ලොව පුරා වන ආයෝජන ආකර්ෂණ මධ්‍යස්ථාන හා සමානවම ව්‍යාපාර පවත්වාගෙන යෑමේ පරිසරයක් නිර්මාණය කරමින් ඒ හරහා විදේශීය සෘජු ආයෝජන ගලා ඒම ඉහළ මට්ටමකට ඔසවා තැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආයෝජක ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා වැඩිදියුණු කළ යුතු ප්‍රධාන ක්ෂේත්‍ර

- නෛතික ක්‍රියාදාමයන්
- රාජ්‍ය ප්‍රතිපත්තිය
- බදු ව්‍යුහය
- සාර්ව ආර්ථික ස්ථායීතාව
- වෙළඳ විවෘතභාවය
- ශ්‍රම වෙළඳපොළ
- තොරතුරු තාක්ෂණයට අනුගත වීම
- යටිතල පහසුකම් ජාලය

මෙම ක්ෂේත්‍ර වල පවතින දුර්වලතා විසඳාලීම ඉලක්ක කරගත් ප්‍රතිසංස්කරණ හරහා දේශීය සහ විදේශීය ආයෝජකයින් මගින් කරනු ලබන ආයෝජන ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසෙනු ඇත.

වි.ස.3 කොවිඩ්-19 හේතුවෙන් රැකියා පටිපාටීන් නිවසේ සිට රැකියාවේ නිරත වීම දක්වා විතැන් වීම

විශේෂයෙන්ම, සම්මත රැකියා චර්යා හා පිළිවෙත් සම්බන්ධයෙන් වසංගතය කාල පරිච්ඡේදය තුළ ශ්‍රම වෙළඳපොළට ඇති කළ පෙර නොවූ විරූ බලපෑම් මධ්‍යයේ, ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යෑමේ තාවකාලික පියවරක් ලෙස නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය (Work from home) වඩාත් ජනප්‍රිය විය.

වාසි	අවාසි
• ගමනාගමන කාලය හා ඒ ආශ්‍රිත වියදම් අඩුවීම • ඉහළ නම්‍යතාව • මෙහෙයුම් පිරිවැය අඩුවීම • ස්ත්‍රී ශ්‍රම සහභාගීත්වය ඉහළ යෑමේ ඉඩප්‍රස්ථා • කාබන් විමෝචනය, රථ වාහන තදබදය සහ තෙල් ආනයනය අඩුවීම	• නිවසේ සිට වැඩ කිරීම සෑම කර්මාන්තයක්ම ,රැකියා ස්වාභාවයක්ම සඳහා යොදාගත නොහැකි වීම • භෞතික සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් හා උපකරණ ප්‍රමාණය සහ එහි ගුණත්වය ප්‍රමාණවත් නොවීම • පහළ මට්ටමේ පවතින ඩිජිටල් සාක්ෂරතාවය • සහ පරිගණක දත්ත ආරක්ෂණය සම්බන්ධයෙන් පවතින ගැටලු

නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමය වඩා සාර්ථක කරගැනීමට සහ එමගින් අපේක්ෂිත උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට නම්, එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන දුෂ්කරතා සහ අභියෝගවලට මුහුණ දීම සඳහා පහසුකම් සපයන්නන්ගේ අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ.

වි.ස.9 තාක්ෂණ ප්‍රතිග්‍රහණය සහ සයිබර් ආරක්ෂාව කෙරෙහි කොවිඩ්-19 හි බලපෑම්

වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ආර්ථික හා සමාජ කටයුතු සීමා කිරීම සහ පසුව සයිබර් අපරාධ වැඩිවීම මධ්‍යයේ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සේවා සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවීමේ පසුබිම හේතුවෙන් සයිබර් ආරක්ෂාව වැඩි අවධානයට ලක්විය.

තොරතුරු තාක්ෂණ සේවා සඳහා ඇති ඉහළ ගිය ඉල්ලුම

ඉහළ ගිය සයිබර් ප්‍රහාර ගණන

අභියෝග ජය ගන්නේ කෙසේද?

- සයිබර් ප්‍රහාර සඳහා ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම
- ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්කරණය (BCP)
- නවතම සයිබර් ආරක්ෂණ පාලන සහ තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අයවැයක් වෙන් කිරීම
- පරිශීලක දැනුවත්භාවය ඉහළ නැංවීම

ඉහත කරුණු වලට අමතරව, 2020 වාර්ෂික වාර්තාව මගින් වසංගත කාලපරිච්ඡේදය තුළ මහ බැංකුවේ මෙහෙයුම් මෙන්ම අදාළ වෙනත් ආයතන විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි...

- ***10වන විශේෂ සටහන: ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග***
  - මුදල් ප්‍රතිපත්තිය
  - විශේෂ ණය යෝජනා ක්‍රම
  - මූල්‍ය අංශය
  - මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීමට එරෙහිව ක්‍රියා කිරීම
  - විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර මෙහෙයුම්
  - මිල ගණන් සංශෝධන
  - බදු සංශෝධන
  - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ නියාමන
  - රජයේ වියදම්
  - ණය කළමනාකරණය

- ***II කොටස: ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ මෙහෙයුම් කටයුතු***
- ***III කොටස:*** මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ ***ප්‍රධාන පරිපාලන විධිවිධාන***

ස්තූතියි.

සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය(2016-2020)

දර්ශකය	ඒකකය	2016	2017	2018	2019 (අ)	2020 (ආ)
මූර්ත අංශය (ඇ)						
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	4.5	3.6	3.3 (අ)	2.3 (ආ)	-3.6
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	11,996	13,328	14,291 (අ)	15,013 (ආ)	14,973
ඒක පුද්ගල ද.දේ.නි. (ඈ)	එ.ජ. ඩොලර්	3,886	4,077	4,057 (අ)	3,852 (ආ)	3,682
විදේශීය අංශය						
වෙළඳ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-10.8	-11.0	-11.8 (අ)	-9.5	-7.4
ජංගම ගිණුමේ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-2.1	-2.6	-3.2	-2.2	-1.3
සමස්ත ශේෂය	එ.ජ. ඩොලර් මිලියන	-500	2,068	-1,103	377	-2,328
විදේශීය නිල සංචිත	එ.ජ. ඩොලර් මිලියන	6,019	7,959	6,919	7,642	5,664
රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)						
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-0.6	-0.7	-1.2	-3.6 (ඊ)	-7.9
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-0.2	0.02	0.6	-3.6 (ඊ)	-4.6
සමස්ත අයවැය ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.3	-5.5	-5.3	-9.6 (ඊ)	-11.1
මධ්‍යම රජයේ ණය (උ)	ද.දේ.නි.යේ % වශයෙන්	79.0	77.9	84.2	86.8	101.0
මුදල් අංශය සහ උද්ධමනය						
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඌ)	සියයට	18.4	16.7	13.0	7.0	23.4
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (ඌ)	සියයට	21.6	14.7	15.9	4.2	6.5
වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (එ)	සියයට	4.0	6.6	4.3	4.3	4.6

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ඈ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.

(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2021 මාර්තු 16 දින නිකුත් කරන ලද 2018 සහ 2019 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ඊ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.

(උ) 2013 මාර්තු මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දි කල්පිරුණි) සහ 2012 ජනවාරි මාසයේ දී රජයේ ආයතන විසින් ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපිය මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණ රුපියල් මිලියන 56,662කි) ඇතුළත් වේ.

(ඌ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

(එ) කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

1950-2020 Stability Sustainability Shared Prosperity 70

කොවිඩ්-19 වසංගතය ගෝලීය ආර්ථිකයට සහ ලෝක වෙළඳාමට මින් පෙර නොවූ විරූ ආකාරයේ බලපෑමක් සිදු කළ අතර, එහි අහිතකර බලපෑම් අවම කර ගැනීම උදෙසා රජයට විවිධ පියවර අනුගමනය කිරීමට සිදු විය...

- ආනයන විකල්ප හඳුන්වා දීම සහ අපනයන ප්‍රවර්ධනය තුළින් දේශීය නිෂ්පාදකයින්ට සහාය දක්වන වෙළඳ ප්‍රතිපත්තියක් දියත් කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු විය
- 2020 වසරේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා වන කාලපරිච්ඡේදය තුළ ආනයන වියදමෙහි සමස්ත පහළ යෑමෙන් සියයට 36කට පමණ (එ.ජ. ඩොලර් බිලියන 1.3 කට පමණ) දායක වූයේ ආනයන සීමා කිරීමට ලක් වූ භාණ්ඩයි
- වසර 28කට පසුව පළමු වරට අපනයන සංවර්ධන අමාත්‍ය සභාව 2020 වසරේ දී රැස් විය

- චීනය, ඉන්දියාව සහ තායිලන්තය සමඟ යෝජිත හවුල්කාරීත්ව ගිවිසුම් හා සම්බන්ධ නිල ද්වි පාර්ශ්වික සාකච්ඡා 2018 වසරේ සිට අඩු ප්‍රගතියක් පෙන්නුම් කර ඇත

ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදුකල අපනයන

වරණීය වෙළඳ ගිවිසුම	2019	2020 (අ)		
	වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	වර්ධනය (%)	දායකත්වය (%)
වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.)	4,020.0	3,671.8	-8.7	83.1
එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ)	2,766.3	2,597.9	-6.1	58.8
ඇමෙරිකා එක්සත් ජනපදය	709.4	585.7	-17.4	13.2
රුසියානු සමූහාණ්ඩුව (ඇ)	150.3	142.2	-5.4	3.2
තුර්කිය	85.3	80.3	-5.9	1.8
ඕස්ට්‍රේලියාව	89.7	79.2	-11.8	1.8
ජපානය	84.9	71.0	-16.4	1.6
කැනඩාව	73.5	61.0	-17.0	1.4
වෙනත් ජී.එස්.පී. ක්‍රම	60.6	54.6	-9.9	1.2
ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) 2000 වසරේ සිට ක්‍රියාත්මකයි	489.6	358.4	-26.8	8.1
ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඇ) 1975 වසරේ සිට ක්‍රියාත්මකයි	179.3	204.7	14.2	4.6
ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) 1989 වසරේ සිට ක්‍රියාත්මකයි	80.5	89.5	11.2	2.0
පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 වසරේ සිට ක්‍රියාත්මකයි	60.8	53.0	-12.8	1.2
දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි	55.9	42.2	-24.4	1.0
සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1995 වසරේ සිට ක්‍රියාත්මකයි	1.7	0.8	-55.6	0.02
වරණීය වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන	4,887.8	4,420.4	-9.6	100.0
ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස	40.9	44.0		